# ප්‍රසම්පාදන නිවේදනයයි

## ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල

පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ රෙදි සේදීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් රාජ්‍ය හෝ පුද්ගලික ආයතන වෙතින් හෝ සමුපකාර සමිතිවලින් යෝජනා කැඳවනු ලැබේ.

## රෙදිපිළි පවිත්‍ර කිරීමේ සේවාව සඳහා මිල කැඳවීම

### පොදු කොන්දේසි

සමාගම්/සමුපකාර රෙජිස්ට්‍රාර්වරයා යටතේ හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කළ සමාගම්, සමුපකාර සමිති, හවුල් ව්‍යාපාර හෝ තනි පුද්ගල ව්‍යාපාරයක් විය යුතු අතර ලියාපදිංචියෙන් පසුව මනා පළපුරුද්දක් ද සහිත දැනටත් අදාල සේවාවේ නිරත ආයතනයක් විය යුතුයි. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

### ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ලබාගැනීම

මෙම සේවාව සඳහා අවශ්‍ය සුදුසුකම් හා කොන්දේසි ඇතුලත් ලේඛන සහිත ඉල්ලුම්පත් 2026.09.14 දින සිට 2026.09.27 වන දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 03.30 තෙක් පොල්ගොල්ලේ පිහිටි ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් ලබා ගත හැක.

### ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම හා ඇප මුදල්

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් ආපසු ගෙවනු ලබන රු.20000/= ක ලංසු සුරක්ෂණය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැම්පතුව "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය"නමට මහබැංකුව පිළිගත් වාණිජ බැංකුවක් මගින් ලබාගත් බැංකු ඇපකරයක් මගින් හෝ ආයතනයේ ගිණුම් අංශයට මුදල් තැම්පත් කිරීම මගින් කළ හැක. ටෙන්ඩර් පත්‍රය සමඟ අදාල බැංකු ඇපකරයේ මුල් පිටපත හෝ ගිණුම් අංශයේ මුදල් තැම්පත් කරන ලද ලදුපතේ පිටපතක් ඇමිණිය යුතුය.

මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ඉල්ලුම්පත් වම්පස උඩ කෙළවරේ **"රෙදිපිළි පවිත්‍ර කිරීමේ සේවාව"**යනුවෙන් සඳහන් කර 2026.09.28 වන දින ප.ව.2.30 ට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ආයතනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැක.

2026.09.28 දින ප.ව.3.00 ට පොල්ගොල්ල, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ දී ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කරන අතර, එම අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ නම් කළ නියෝජිතයෙකුට ඒ සඳහා සහභාගී විය හැක. ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,
පොල්ගොල්ල.
දු.ක.0812498679/0812498680